සැ. යු. — මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2011 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා වූ කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,824 - 2013 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2013.08.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1742 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 සැප්තැම්බර් මස 06 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1741 - B 80758— 3,400 (2013/08)
F 1 -

# පළාත් සභා නිවේදන

## 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(1) වැනි වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) ඌ වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වැනි වගන්තියෙන් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබ, මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව, 2012.09.21 දින පැවති දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා, මාසික සභා රැස්වීමේ අංක 06-1-6 දරන යෝජනාවෙන් සම්මතය ලබා ඇත. 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(1) වැනි වගන්තිය ප්‍රකාර එකී අතුරු ව්‍යවස්ථාව බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ වෙළඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ
ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන,
විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා
රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ වෙළඳ අමාත්‍ය.

2013 ජූලි මස 30 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ථි මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ, ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

### පසුබිම් වාර්තාව

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි ත්‍රිරෝද රථ නතර කර තැබීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීම පිණිස ඉදිරිපත් කෙරෙන පසුබිම් වාර්තාවයි.

වර්ග සැතපුම් 115.03 පුරා පැතිර ඇති දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරන ලද සමීක්ෂණයකින් අනාවරණය වූයේ පොදු මහජනතාවගේ ගමන් බිමන් සඳහා ත්‍රිරෝද රථය යොදා ගැනීම බෙහෙවින් ජනප්‍රිය වී ඇති බවයි. දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රධාන මාර්ග දෙපස, හා ඇතැම් අතුරු මාර්ග දෙපසත්, කුලී ගමන් අපේක්ෂාවෙන් ත්‍රිරෝද රථ නතර කර තිබෙනු දැකගත හැකිය. මෙම ත්‍රිරෝද රථ නැවතුම් ස්ථාන බෙහෙවින් අක්‍රමිකව පවතින බැවින් පදිකයන්ට හා මහ මඟ ධාවනය කෙරෙන රථ වාහන වලට මහත් අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වේ.

මෙම තත්ත්වයන් අවම කර පොදු මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, ත්‍රිරෝද රථ ගාල් ආශ්‍රිතව සිදුවන අපරාධ අවම කිරීම සඳහාත්, රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ආකාරයෙන් ත්‍රිරෝද රථ නතර කර තැබීම වැලැක්වීම සඳහාත්, නිසි පරිදි බලපත්‍ර නොමැති නුපුහුණු රියදුරන් නිසා සිදුවන මාර්ග අනතුරු අවම කිරීම සඳහාත්, ත්‍රිරෝද රථ රියදුරන්ගේ ජීවන වෘත්තිය ආරක්ෂා කිරීම සඳහාත්, ත්‍රිරෝද රථ නැවතුම් ස්ථාන විධිමත් කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති යුතුකමක් කොට සලකමු.

ත්‍රිරෝද රථ නවතා තැබීමේ ස්ථාන විධිමත් කිරීම හා සභාවට අතිරේක ආදායම් මාර්ගයක් ඇති කිරීම මෙම අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීම තුළින් අපේක්ෂිතය.

### දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

***ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත***

1. මේ අතුරු ව්‍යවස්ථා දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ත්‍රිරෝද නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ අතුරු ව්‍යවස්ථා සභා බල ප්‍රදේශය තුල ත්‍රිරෝද නවතා තැබීම විධිමත් කිරීම, පාලනය කිරීම හා නවතා තැබීමේ ස්ථාන සඳහා ගාස්තු අය කිරීම සඳහා පනවනු ලැබේ.

3. (1) සභා බල ප්‍රදේශය තුල ත්‍රිරෝද රථ නවතා තැබිය යුතු ස්ථානයේ නවතා තැබිය යුතු උපරිම ත්‍රිරෝද රථ සංඛ්‍යාව සභාවේ යෝජනා සම්මුතියක් මගින් නිශ්චය කළ යුතු අතර, එම තීරණ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනක හෝ සිට ක්‍රියාත්මක වන්නේ ය.

(2) ඉහත 3.1 ව්‍යවස්ථාව අනුව නිශ්චය කළ ත්‍රිරෝද රථ නවතා තබන ස්ථාන හා සංඛ්‍යාව සංශෝධනය කළ යුතු යැයි සභාවට හැඟී යන්නේ නම් සභා සම්මුතියක් මගින් එසේ කළ හැකි අතර, එය *ගැසට් පත්‍රයේ* පළ කල දින සිට හෝ එහි සඳහන් නිශ්චිත දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

(3) ත්‍රිරෝද රථ නැවතුම් පොළ ස්ථාන නිශ්චය කිරීම, එහි පරාසයන් තීරණය කිරීම හා නතර කළ හැකි උපරිම ත්‍රිරෝද රථ සංඛ්‍යාව තීරණය කිරීම සඳහා හෝ එම තීරණ සංශෝධනය සඳහා පළමු වැනි උපලේඛනයේ සඳහන් අයගෙන් සමන්විත කමිටුවක නිර්දේශ සභාව විසින් ලබාගත යුතු ය.

(4) ඉහත 3(1) ව්‍යවස්ථාව අනුව ත්‍රිරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන හඳුනා ගැනීම පිණිස වන පුවරුවක් සෑම නැවතුම් පොළක ඉදිරිපිට සවි කළ යුතු වන අතර, එම පුවරුවේ අදාල නැවතුම් පොලේ සංකේත අංකය ප්‍රදර්ශනය කළ යුතු ය.

(5) ව්‍යවස්ථාව අනුව නැවතුම් පොළක නවතා තැබිය හැකි උපරිම ත්‍රිරෝද රථ සංඛ්‍යාව අදාල පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

(6) නැවතුම් පොළෙහි ත්‍රිරෝද රථ ක්‍රමානුකූලව නවතා තැබිය යුතු අතර, නවතා තැබිය යුතු ආකාරය සභාවේ බලයලත් නිලධාරියකු විධිමත්ව දැනුම් දෙන ආකාරයට විය යුතු ය.

4. ප්‍රාදේශීය සභාව විසින් ත්‍රිරෝද රථ නවතා තැබීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවැනි උපලේඛනයේ සඳහන් ආකාරයේ බලපත්‍රයක් සභාපතිවරයා විසින් නිකුත් කිරීම හා ඒ සඳහා ගාස්තු පනවා අය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

5. ත්‍රිරෝද රථ නැවතුම් පොලක නවතා තබන ත්‍රිරෝද රථ බලපත්‍රය ලබා දීමේ දී නැවතුම් පොළට ආසන්නතම පදිංචිකරුවන්ට අයත් ත්‍රිරෝද රථ වලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.

6. (1) තුන්වන උපලේඛනයේ සඳහන් ආදර්ශ අයදුම් පත පරිදි තම ස්ථිර පදිංචියට ආසන්නතම ත්‍රිරෝද රථ නැවතුම් පොළෙහි නවතා තැබීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් බල පත්‍රයක් ඉල්ලුම්

කල යුතු අතර, ඒ සඳහා සභාව විසින් තීරණය කරන ලද මුදලක් ගෙවා අයදුම් පත්‍රයක් සභාවෙන් ලබා ගත යුතු ය. මෙම අයදුම් පත්‍ර ගාස්තුව සභාව විසින් ගනු ලබන තීරණ අනුව කලින් කලට සංශෝධනය කළ හැකි වේ.

(2) ත්‍රිරෝද රථ පදවන්නා අයිතිකරු නම්. ඔහුගේ ද පදවන්නා කුලී රියදුරෙකු නම් ඔහුගේ සහ අයිතිකරුගේ ද පහත සඳහන් ලේඛන වල ඡායාස්ථ පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය. එම අයදුම්පත තුන්වන උපලේඛනයේ සඳහන් පරිදි විය යුතු ය.

(i) ත්‍රිරෝද රථ හිමිකරුගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය,
(ii) ත්‍රිරෝද රථයේ ලියාපදිංචි සහතිකය,
(iii) කුලී රියැදුරාගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය.

(3) සභාවේ බලපත්‍ර ලත් ත්‍රිරෝද රථ සම්බන්ධ ලේඛනයක් පවත්වා ගෙන යා යුතු අතර, බලපත්‍රය අවලංගු කරනු ලැබූ විට ඒ බව සටහන් කර රතු තීන්තෙන් සලකුණු කළ යුතු ය.

(4) සභාව විසින් වාර්ෂිකව ත්‍රිරෝද රථ නවතා තැබීම සඳහා බලපත්‍රය ලබා දිය හැක.

(5) වලංගු බලපත්‍රයේ ඡායා පිටපතක් පැහැදිලිව පිටතට පෙනෙන සේ ත්‍රිරෝද රථයේ ඉදිරිපස වීදුරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

(6) ත්‍රිරෝද රථයේ දකුණු පසින් මගීන්ට නැගීම හෝ බැසීම කළ නොහැකි වනසේ අහුරා තිබිය යුතු ය.

(7) බලපත්‍රය ත්‍රිරෝද රථයෙහි ලියාපදිංචි හිමිකරු නමට නිකුත් කළ යුතු ය.

(8) බලපත්‍රයේ වලංගු කාල සීමාව අවසන් වීමට සති දෙකකට පෙර බලපත්‍රය අළුත් කරවා ගැනීම ත්‍රිරෝද රථ අයිතිකරු විසින් කළ යුතු ය.

(9) ඉහත 6.4 අනුඡේදය අනුව වාර්ෂිකව පනවා අය කළ යුතු බලපත්‍ර ගාස්තුව සභාව විසින් තීරණය කළ යුතු අතර, එම තීරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයක හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි අය කළ යුතු ය.

10. 4 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස ත්‍රිරෝද රථ නැවතුම් පලකට ත්‍රිරෝද රථයක් ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතු යි.

11. නිකුත් කළ වලංගු බලපත්‍රයක් ඇත්තේ වුව ද පොලිස් නිලධාරියකු විසින් හෝ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධාරියකු විසින් තාවකාලිකව ත්‍රිරෝද රථ නැවතුම් පොළෙන් ත්‍රිරෝද රථ ඉවත් කිරීමට විධාන කළ හැකි අතර මෙම බලපත්‍ර ඊට බාධාවක් නොවිය යුතු ය.

7. නැවතුම් පොළක වෙනත් වාහන ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතු ය.

8. නැවතුම් පොළට ඇතුළු වන ස්ථානයට හෝ ඉන් පිටවන ස්ථානයට බාධාවන අයුරින් ත්‍රිරෝද රථ හෝ වෙනත් වාහන හෝ නවතා තැබීම නොකළ යුතු ය.

9. නැවතුම් පොළට ත්‍රිරෝද රථය ඉවත් කර ගැනීමේ කාර්යයට අදාළ යම් අළුත්වැඩියාවක් මිස, නැවතුම් පොළ ඇතුලත වෙනත් කිසිදු ආකාරයක අළුත්වැඩියාවක් කිරීම නොකළ යුතු ය.

10. යම් ත්‍රිරෝද රථයක් නතර කර තැබීම සඳහා බලපත්‍රයක් ලබා ගෙන ඇත්තේ යම් නැවතුම් පොළකට ද, එම බලපත්‍රය අදාළ වන නැවතුම් පොළෙහි හැර වෙනත් කවර හෝ ස්ථානයක කුලී ගමනක් අපේක්ෂාවෙන් ත්‍රිරෝද රථයක් නවතා තැබීම නොකළ යුතු ය.

11. බලපත්‍රය හිමි ත්‍රිරෝද රථ නැවතුම් පොළක නතර කර ඇති අවස්ථාවේ දී සේවයේ යෙදී සිටින රියදුරන් පිටස්තර පුද්ගලයන් ත්‍රිරෝද රථ නැවතුම් පළට කැඳවා නිකරුනේ ගැවසීමට ඉඩදීම නොකළ යුතු ය.

12. නැවතුම් පොළක කවර හෝ තැනැත්තෙකු විසින් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම හෝ දුරාචාරයේ හැසිරීම හෝ වෙනත් කිසිදු පීඩාකාරී ක්‍රියාවක් හෝ නොකළ යුතු අතර එවැනි ක්‍රියාවක් කිරීම සඳහා ඉඩ නොදීමට නැවතුම් පළ භාවිතා කිරීමට අවසර ලද පුද්ගලයින්ගේ වගකීමක් වේ.

13. බලපත්‍රයක් හිමි කවර වූ හෝ තැනැත්තෙකු විසින් නැවතුම් පළක විෂමාචාර ක්‍රියාවක නිරත වූ බවට ජනතාවගෙන් පැමිණිල්ලක් ලද අවස්ථාවක ඒ බව පරීක්ෂණයක් පවත්වා සනාථ වුවහොත් ඔහුගේ බලපත්‍රය අහෝසි කිරීමේ බලය සභාව සතු වේ.

14. සභාපතිවරයා හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ නිලධාරියකු හෝ පොලිස් නිලධාරියකු හෝ ඉල්ලා සිටි ඕනෑම විටක වලංගු බලපත්‍රයේ මුල් පිටපත් ත්‍රිරෝද රථයේ රියදුරු හෝ අයිතිකරු විසින් ඉදිරිපත් කළ යුතු ය.

15. (1) මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයන් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එකී වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකට යටත් කළ හැකි ය. එකී උල්ලංඝනය කිරීමේ වරද දිගින් දිගටම කරගෙන යන අවස්ථාවක නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු හෝ එකී උල්ලංඝනය කිරීමේ වරද කෙරෙහි අවධානය යොමු කරන ලිඛිත දැන්වීමක් සභාපති විසින් හෝ තත් කාර්යය සඳහා ඔහුගෙන් බලයලත් නිලධාරියකු හෝ භාර කරනු ලැබීමෙන් පසු හෝ එකී වරද තවදුරටත් කරගෙන යනු ලබන සෑම දිනක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

(2) ඉහත 15(1) අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දඩ මුදල් සභාවේ පොදු අරමුදලට බැර විය යුතු ය.

16. මෙම ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන් වුව ද සභාවේ යෝජනා සම්මුතියක් මගින් මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කොට අළුත් ව්‍යවස්ථාවක් සැකසීම හෝ අමතර අතුරු ව්‍යවස්ථාවන් සෑදීම කළ හැකි වන්නේ ය.

17. අර්ථ නිරූපනය -

"සභාව" යන්නෙන් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ නිලධාරියෙකු" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලබන ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද,

"සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ බලය ලත් නිලධාරියෙකු" යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු ද,

"බල ප්‍රදේශය" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කර ඇති දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය ද,

"ත්‍රිරෝද රථය යන්නෙන්" කුළී ගමන් අපේක්ෂාවෙන් නවතා තබා ගන්නා වූ ත්‍රිරෝද රථයක් ද,

"කුලී රියදුරකු" යන්නෙන් ත්‍රිරෝද රථය පදවන අයිතිකරු හෝ එම රථය පැදවීම සඳහා අයිතිකරු විසින් යොදවා ඇති අය ද,

"නියමිත නැවතුම් පොළ" යන්නෙන් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් නිශ්චය කරනු ලැබූ ත්‍රිරෝද රථ නැවතුම් පොළ ද,

"නැවතුම් පොළ" යන්නෙන් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කරන ලද යම් නිශ්චිත නැවතුම් පළක් ද,

"මාසිකව" යන්නෙන් එක් එක් මාසය ආරම්භයේ පළමු වෙනිදා සිට ඒ ඒ මාසයට අදාළ දින 28 හෝ දින 30 හෝ 31 කින් සමන්විත වූ මාසයකින් ද,

"ත්‍රෛමාසිකව" යන්නෙන් මාසිකව යන අර්ථකථනය මගින් දී ඇති දින ගණන ඇති ජනවාරි 01 වැනිදායින් ආරම්භව අනුයාත මාස 03 බැගින් දෙසැම්බර් 31 වැනි දා දක්වා ද,

"වාර්ෂික" යන්නෙන් වර්ෂයක් ජනවාරි 01 වැනිදායින් අරම්භව දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන ලිත් වර්ෂයක් ද,

"පොලිස් නිලධාරියකු" යන්නෙන් 53 වැනි අධිකාරිය වන 1865 අංක 16 දරන පොලිස් ආඥාපනතේ 104 වැනි වගන්තිය මගින් දී ඇති අර්ථකතනයම ද,

"වෙනත් වාහන" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකතනයම ද,

"ලියාපදිංචි හිමිකරු" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකතනයම ද,

"පීඩාකාරී ක්‍රියාව" යන්නෙන් පීඩා ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකතනයම ද අදහස් වේ.

18. මේ අතුරු ව්‍යවස්ථා සිංහල හා දෙමළ භාෂා පාඨ සම්බන්ධව යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

*පළමු වැනි උපලේඛනය*


*3.3 අතුරු ව්‍යවස්ථාව*

පත්කරනු ලබන මාර්ග කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

1. කමිටුවේ සභාපති ප්‍රාදේශීය සභාවේ සභාපති විය යුතු අතර, ලේකම් සභාවේ ආදායම් පරීක්ෂක වේ,
2. ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ කාර්මික නිලධාරි,
3. මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු,
4. පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු,
5. කළුතර මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් කරනු ලබන නියෝජිතයෙකු,
6. කළුතර බස් කම්පැණි ලිමිටඩ් හි සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු,
7. සභා බල ප්‍රදේශයට අයත්, පොලිස් ස්ථානයන් හි රථ වාහන පොලිසියේ ස්ථානාධිපතිවරුන් හෝ ඔවුන් විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු,
8. සභා බල ප්‍රදේශය තුළ ඇති ත්‍රිරෝද රථ සංගම්වල නියෝජිතයෙකු.

*දෙවැනි උපලේඛනය*

*4 වැනි අතුරු ව්‍යවස්ථාව*




සෙ. මී. 13ක විශ්කම්භය සහිත වෘත්තයකි. ඇතුලත වෘත්තය නිල් පැහැයෙන් ද පිටත බෝඩරය කහ පැහැයෙන් ද යුත් ප්‍රාදේශීය සභා ලාංඡනය සහිත ආකෘතියේ පරිදි කරුණු අඩංගු ස්ටිකරයකි.

*තුන්වැනි උපලේඛනය*

*6.2 අතුරු ව්‍යවස්ථාව*

*ත්‍රිරෝද රථ නැවතුම්පොළ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය*

01. i. අයදුම්කරුගේ නම :————.
 ii. ස්ථිර පදිංචි ලිපිනය :————.
 iii. වරිපනම් අංකය :————.
 iv. ස්ථිර පදිංචියට අදාල පළාත් පාලන ආයතනය :————.
 v. ජාතික හැඳුනුම්පත් අංකය :————.

02. i. ත්‍රිරෝද රථ ලියාපදිංචි අංකය :————.
 ii. පදවන්නා අයිතිකරු ද නැත්නම් කුළී රියදුරුද යන වග :——.

 *(අ)* අයිතිකරු නම් වලංගු රියදුරු බලපත් අංකය :————.
 *(ආ)* කුළී රියදුරෙකු නම් :

 *(අ)* රියදුරුගේ නම :————.
 *(ආ)* ස්ථිර පදිංචි ලිපිනය :————.
 *(ඇ)* ජාතික හැඳුනුම්පත් අංකය :————.
 *(ඈ)* වලංගු රියදුරු බලපත් අංකය :————.

03. බලපත්‍රය ඉල්ලුම් කරනු ලබන ත්‍රිරෝද රථ නැවතුම්පොළ :————.

04. බලපත්‍රය ඉල්ලුම් කරන කාලය : මාසයකට/මාස 03 කට/අවුරුද්දකට :————.

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, යම් හෙයකින් එම තොරතුරු සාවද්‍ය බව තහවුරු වුවහොත්, මාගේ ත්‍රිරෝද රථ නැවතුම්පොළ බලපත්‍රය පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමට යටත් බවත්, ප්‍රාදේශී සභාව විසින් පනවා ඇති ත්‍රිරෝද රථ නැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් පිළිපැදීමටත් එකඟ වෙමි.

දිනය :————.

........................................................ මහත්මා/මහත්මියට.......................... අංක දරන ත්‍රිරෝද රථය................................ දරන නැවතුම් පොළෙහි නැවැත්වීම සඳහා බලපත්‍රය......................................... .කාලයකට ලබා දීම අනුමත කරමි.

————,
සභාපති
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

දිනය :————.

08-544

---

## නිවේදනයයි

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ *(අ)* ඡේදය සමග කියවිය යුතු, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ ඌව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ සහ 2010.10.05 දිනැති අංක 1778/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ (IV) (අ) වැනි කොටසේ නිවේදනය කරනු ලැබූ, ඌව පළාතේ පළාත් පාලන ආයතනවලට අදාළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඌව පළාතේ, පළාත් සභාව විසින් 2013.04.04 වැනි දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේ දී සම්මත කිරීමෙන් එය අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි."

එල්. එල්. අනිල් විජේසිරි,
ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය,
ඌව පළාත් සභාව,
බදුල්ල.

2013 ජූලි මස 29 වැනි දින,
බදුල්ලේ දී ය.

08-603/1

## නිවේදනයයි

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ *(අ)* ඡේදය සමග කියවිය යුතු, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ ඌව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ සහ 2010.11.02 දිනැති අංක 1678/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ (IV) (අ) වැනි කොටසේ නිවේදනය කරනු ලැබූ, ඌව පළාතේ පළාත් පාලන ආයතනවලට අදාළ මදුරුවන් හා රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඌව පළාතේ, පළාත් සභාව විසින් 2013.04.04 වැනි දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේ දී සම්මත කිරීමෙන් එය අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි."

එල්. එල්. අනිල් විජේසිරි,
ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය,
ඌව පළාත් සභාව,
බදුල්ල.

2013 ජූලි මස 29 වැනි දින,
බදුල්ලේ දී ය.

08-603/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.